පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 12 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- ක්‍රිස්තියානි ධර්මය - I

පාසලේ නම : ..........................................

ඇතුළත්වීමේ අංකය : ....................... කාලය : පැ.2 යි

## I පත්‍රය

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

අංක 01 සිට 50 දක්වා ඇති ප්‍රශ්න වලට 1,2,3,4,5 පිළිතුරු වලින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ලකුණු කරන්න.

1. කිතුනුවන්ගේ අති උතුම් ග්‍රන්ථය වූ ශු. බයිබලය ලතින් භාෂාවට පරිවර්තනය කර ලද්දේ.

    1. ශු. අගෝස්තීනු තුමා
    2. ශු. ජෙරොම් තුමා
    3. ශු. ටර්ටුලියන් තුමා
    4. ශු. සිරිල් තුමා
    5. ශු. බැසිල් තුමා

2. සාමුවෙල් විසින් සාවුල් ''රජු'' ලෙසින් ජනතාවට හඳුන්වා දුන් ස්ථානය වනුයේ,

    1. හෙබ්‍රොන්
    2. මිදියන්
    3. දාන්
    4. මිස්පා
    5. බෙයර්ෂෙබා

3. දේවානුභාවයෙන් රචනා වූ ශු. ලියවිල්ලේ අරමුණක් නොවන්නේ,

    I. එකමුතු කිරීම
    II. ඉගැන්වීම
    III. දුර්මත දුරුකිරීම
    IV. හික්මවීම
    V. ධර්මිෂ්ඨ ජීවිතයක් ගෙවීම

4. එළියා දිවැසිවරයා හා බාල් පූජකයන් පිළිබඳ සිද්ධිය සිදුවූයේ,

    1. වෙරළබඩ තීරයේ
    2. බටහිර කඳුවල
    3. කාර්මෙල් කන්දේ
    4. පිලිස්ති මිටියාවතේ
    5. ජෝර්දාන් මිටියාවතේ

5. ගිවිසුම් කරඬුව ජෙරුසලමට ගෙන ආ රජතුමා වනුයේ,

    I. ශෙදකියා
    II. සලමොන්
    III. දාවිත්
    IV. සාවුල්
    V. ජොසියා

6. ජාකොබ් තුමා ඉහළ පහළ යන දේවදූතයන් සහිත පුදුම සිහිනයක් දුටු ස්ථානය වනුයේ,

1. බෙතෙල්
2. හාරාන්
3. සමාරිය
4. ෂෙකෙම්
5. හේබ්‍රොන්

7. මැසරොටික් පිටපත භාවිතා කරන ජනතාව වන්නේ,

1. කතෝලික හා ක්‍රිස්තියානි
2. කතෝලික හා ජුදා
3. ජුදා හා ප්‍රෙස්බිටේරියන්
4. ප්‍රෙස්බිටේරියන් හා ක්‍රිස්තියානි
5. ජුදා හා ක්‍රිස්තියානි

8. දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාවේ නීති වේදියකු වනුයේ,

1. නෙහෙමියා
2. එස්රා
3. සාමුවෙල්
4. එලියා
5. ජොෂියා

9. දෙවියන් වහන්සේ මිනිසුන් අතර 'සුපිරි' මිනිසෙක් ලෙස හඳුන්වාදෙන සම්ප්‍රදාය නම්,

1. එලොහිම්
2. වාචික
3. ලේඛණ
4. යාවේ
5. පූජක

10. මැවීම් පිළිබඳ දෙවන කතාවට පසුබිම සපයන්නේ,

1. දස පනත
2. මැවීම් පිළිබඳ පළමු කතාව
3. සුමේරියානු ජන කතා
4. පංච පුස්තකය
5. නික්මයාම සිද්ධිය

11. ''අපාර්'' යන්නෙහි අරුත වන්නේ,

1. සාමය
2. පොළව
3. අහස
4. දූවිල්ල
5. වගාකිරීම

12. පිලිප්පි කයිසාරිය නුවර තැනවූයේ,

I. ආණ්ඩුකාර පොන්තියුස් පිලාත්
II. ආණ්ඩුකාර මහා හෙරෝද්
III. ආණ්ඩුකාර දෙවන හෙරෝද් පිලිප්
IV. ආණ්ඩුකාර හෙරෝද් ඇන්ටිපස්
V. ආණ්ඩුකාර අර්කෙලාවුස්

13. ඉශ්‍රායෙල් වරුන්ගේ ශුද්ධත්වයේ සංකේතය වනුයේ,

1. ගිවිසුම් කරඬුව
2. බාල් වන්දනාව
3. දස පනත ලැබීම
4. පුපය සහ මිදි රස
5. ශු. බයිබලය

14. ජෙරුසලම් දේව මාලිගය ආශ්‍රිතව භාවිතා වූ මුදල් වර්ගය වනුයේ,

I. යූරෝ ය
II. ඩ්‍රැක්මා ය
III. රෝම කාසිය
IV. ෆ්‍රෑන්ක් ය
V. ඩොලරය

15. 'සිනගෝගය' යන්නට ග්‍රීක භාෂාවේ අර්ථය වනුයේ,

I. මන්ත්‍රණ සභාව
II. ප්‍රසංශාව
III. දේව මාලිගය
IV. ආසිරි ගැන්වීම
V. රැස්වීම

16. දාවිත් රජතුමාගේ උපන් ගම වන්නේ,

I. නාසරතය
II. දමස්කය
III. ජෙරුසලම
IV. එප්‍රාතා
V. සමාරිය

17. ප්‍රථමයෙන් ලියවී ඇති සුභාරංචිය හා නව ගිවිසුමේ පළමුවෙන් සඳහන් සුභාරංචිය ඇතුළත් පිළිතුර වනුයේ,

I. ශු. මාක්, ශු. ජොහාන්
II. ශු. මතෙව්, ශු. ජොහාන්
III. ශු. ලූක්, ශු. මාක්
IV. ශු. මාක්, ශු. මතෙව්
V. ශු. ජොහාන්, ශු. මතෙව්

18. ශු. ජොහාන් සුභාරංචියේ පමණක් අඩංගු ප්‍රාතිහාර්ය යන් දෙකක් වනුයේ,

1. වතුර මිදියුෂට හැරවිම, ලාසරස් මරණින් නැගිටුවීම
2. නායිම් නුවර සිදුවීම, මාරුත දමනය
3. වතුර මිදියුෂට හැරවීම, අංශභාග රෝගියා සුවකිරීම
4. පන්දහසකට කෑම දීම, වතුර මිදියුෂට හැරවීම
5. මාරුත දමනය, පන්දහසකට කෑමදීම

19. ක්‍රිස්තුන් වහන්සේගේ අපෝස්තුළුවරුන් වන සෙබදිගේ පුතුන් දෙදෙනා වනුයේ,

1. සීමෝන් හා ඇන්ඩෲ
2. ජාකොබ් හා ජොහාන්
3. ජුදාස් හා ජාකොබ්
4. ජෝහාන් හා පේදුරු
5. ජාකෝබ් හා ඇන්ඩෲ

20. ''සමිඳාණන් වහන්සේ උසස් කළ සේක'' යන අරුත ලත් දිවැසිවරයා වනුයේ,

I. එසකියෙල්
II. ජෙරමියා
III. යෙසායා
IV. ආමෝස්
V. හොසියා

21. දෙවන ජෙරබෝවාම් රජුගේ පාලන සමයේ දිවැසිවර සේවාව පටන් ගත් දිවැසිවරයා වනුයේ,

I. යෙසායා
II. ජෙරමියා
III. හොසියා
IV. එසකියෙල්
V. ආමෝස්

22. 'ප්‍රොෆෙටේස්' යන්නෙහි අරුත

I. දේව පණිවිඩය ප්‍රකාශ කරන්නා
II. යමෙකු වෙනුවෙන් මැදිහත් වන්නා
III. යමෙකු වෙනුවෙන් කතා කරන්නා
IV. දේව වචනය ගෙන යන්නා
V. දෙවිඳුන්ට සේවය කරන්නා

23. ඉශ්‍රායෙල් ඉතිහාසයේ දේශපාලනික අර්බුධ සහිත යුගයක සේවය දියත් කළ දිවැසිවරයා වනුයේ,

I. යෙසායා
II. මීකා
III. හොසියා
IV. එසකියෙල්
V. ජෙරමියා

24. ගීතාවලිය පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් ප්‍රථම වරට කරන ලද්දේ,

1. රේමන් බ්‍රවුන්
2. ජේ. වේල්හවුසන්
3. ආතර් වයිසර්
4. සිග්මන් මොවින්කල්
5. හර්මන් ගුන්කල්

25. ප්‍රඥා සාහිත්‍යයේ ප්‍රධාන අරමුණ වන්නේ,

1. ජීවිතය සාර්ථක ලෙස ගෙවීම හා දැහැමි ලෙස ගෙවීම
2. අධ්‍යාත්මික වර්ධනය
3. ජීවිතයේ ගැටළු විසඳීම
4. දෙවිඳුන්ට ප්‍රසන්නව දිවිගෙවීම
5. මාර්ගෝපදේශය

26. සැබෑ ප්‍රේමයට අදාළ නොවන කරුණකි.

1. උඩඟු නොවීම
2. උදම් ඇනීම
3. ඊර්ෂ්‍යා නොවීම
4. හනික නොකිපීම
5. අවිනිත නොවීම

27. අවසන් විනිශ්චයට පදනම වනුයේ,

I. යහපත් ක්‍රියා
II. දසපනත
III. භාග්‍ය අට
IV. පුණ්‍ය ක්‍රියා
V. ශු. සභා පනත්

28. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත රචනා කළේ,

I. ක්‍රි.ව. 63-70
II. ක්‍රි.ව.90-100
III. ක්‍රි.ව. 65-70
IV. ක්‍රි.ව. 85-90
V. ක්‍රි.ව. 80-90

29. ජෙරුසලම් මන්ත්‍රණා සභාවේ නායකත්වය උසුලනු ලැබුවේ,

| | | | |
|---|---|---|---|
| I. | සභා මූලිකයන් | IV. | ජාකොබ් තුමා |
| II. | පරිසිවරුන් | V. | ස්තේපන් තුමා |
| III. | පේදුරු තුමා | | |

30. ශු. පාවුළු තුමා අයත් ගෝත්‍රය වනුයේ,

| | | | |
|---|---|---|---|
| I. | ජුදා | IV. | ගමාලියෙල් |
| II. | තාර්සස් | V. | බෙන්ජමින් |
| III. | ලෙවී | | |

31. ශු. පාවුළු තුමාගේ දෙවන ධර්ම දූත චාරිකාවට සම්බන්ධ වූවන් වනුයේ.

A. ජොහාන් මාක් B. සීලස් C. ලූක් D. බර්ණබස් E. තිමෝති F. පේදුරු

| | | | |
|---|---|---|---|
| I. | A B C | IV. | B C D |
| II. | A B D | V. | B D F |
| III. | B C E | | |

32. දේව රාජ්‍ය පිළිබඳ ශුභාරංචිය අපොස්තුළුවරුන් පළමුව රැගෙන ගියේ,

| | | | |
|---|---|---|---|
| 1. | අන්‍ය ජාතීන් වෙත | 4. | සමාරියයන් වෙත |
| 2. | ජුදෙව් ජනතාව වෙත | 5. | එබ්‍රෙව්රුන් වෙත |
| 3. | පව්කරුවන් වෙත | | |

33. ධර්ම දූත සේවයේ යෙදීමේදී දෙවියන් වහන්සේගේ සුභාරංචි පණිවිඩය ප්‍රතික්ෂේප කරන අය වෙත දක්වන ප්‍රතිචාරය වනුයේ,

| | | | |
|---|---|---|---|
| I. | සාමය වේවායි ප්‍රකාශ කිරීම | IV. | සිප වැළඳ ගැනීම |
| II. | පාදවල දූවිලි ගසා දැමීම | V. | ශාප වේවායි ප්‍රකාශ කිරීම |
| III. | ස්තුති ප්‍රසංශා කිරීම | | |

34. විශේෂ ඉගැන්වීමකදී ජේසුස් වහන්සේ භාවිතා කළ යෙදුම වනුයේ,

| | | | |
|---|---|---|---|
| I. | මනුෂ්‍ය පුත්‍රයා මෙසේ වදාරණ සේක | IV. | දෙවිදානෝ මෙසේ පවසන සේක |
| II. | ඔබ සමගද වන සේක්වා | V. | ඔබම ප්‍රකාශ කරන සේක්වා |
| III. | සවන් ඇත්තෝ සවන් දෙත්වා | | |

35. ශු. පාවුළු තුමා අතින්ම ලියැවුණු සංදේශ දෙකකි

| | | | |
|---|---|---|---|
| I. | 1 තිමති හා 2 තිමති | IV. | ගලාති හා රෝම |
| II. | තීතස් හා එපීස | V. | එපීස හා කොලොස්සි |
| III. | පිලමොන් හා 1 තෙසලෝනික | | |

36. ශු. පාවුළු තුමා ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර තිබිය යුතු සම්බන්ධතාවය සමාන කරනුයේ,

I. ක්‍රිස්තුස් වහන්සේ හා සභාව ට
II. දේවජනතාව හා පූජකයා ට
III. මිදිවත්ත හා ස්වාමියා ට
IV. එඬේරා හා බැටළුවන් ට
V. ක්‍රිස්තුස් වහන්සේ හා දේව රාජ්‍ය ට

37.ජේසුස් වහන්සේගේ පාද ස්ත්‍රියක විසින් බෙතානියේදී ආලේප කිරීම වාර්තා කරන්නේ,

I. ශු. මාක්, ශු. ජොහාන්, ශු. ලූක්
II. ශු. ජොහාන්, ක්‍රියාපොත,රෝම
III. ශු. ලූක්, ගලාති, එපීස
IV. ශු. මතෙව්, ශු. ලූක්, ශු. මාක්
V. ශු. මාක්, ශු. මතෙව්, ශු. ජොහාන්

38 ''මාකාරියෝ යි'' යන ග්‍රීක වදනින් ප්‍රකාශ වන අදහස වන්නේ

I. පොත් පිංච
II. භාග්‍යවන්තයෝ
III. සුභාරංචිය
IV. ගැලවීමේ සැලැස්ම
V. දේව ආදරය

39. ලෝකය තුළ දේව රාජ්‍ය ගොඩ නැගීමට ජේසුස් වහන්සේ කැඳවූ වන්,

I. බොහෝ අය බදු අය කරන්නෝය
II. බොහෝ අය අන්‍ය ජාතිකයෝය
III. බොහෝ අය ධීවරයෝය
IV. බොහෝ අය ගුරුවරුය
V. බොහෝ අය වෙළෙන්දෝය

40. 'අපොස්ටලොස්' යන ග්‍රීක වචනයේ සිංහල වචනය වනුයේ,

I. වෙනත් අයෙකුලෙන් ඉගෙනුම ලබන්නා
II. ගෝලයා
III. යවනු ලබන්නා
IV. ශ්‍රාවකයා
V. අපෝතුළුවරයා

41. ප්‍රථම වතාවට 'ක්‍රිස්තියානි යන නම ශ්‍රාවකයන්ට භාවිතා කළේ,

I. සිරියාවේ අන්තියෝකියේදී
II. එපීසියේදී
III. ලූස්ත්‍රාවේදී
IV. පර්ශායේදී
V. ඉකෝනියේදී

42. ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ ජුදා ජනතාවගෙන් වෙන් වූ පිරිසක් ලෙස සැලකෙන්නේ,

I. පරිසිවරුන්
II. සමරිතානුවරුන්
III. සද්දුසිවරුන්
IV. ලෙවි වරුන්
V. විනයධරයන්

43. ජේසුස් වහන්සේ අත් අඩංගුවට ගනු ලැබුවේ ....................... යාච්ඤා කරමින් සිටියදීය.

I. දේව මාලිගාවේ
II. ඔලිව කන්දේදී
III. ගෙත්සමනියේදී
IV. ගලීල මුහුදේදී
V. ගෙනසෙරෙත්විල අසලදී.

44. දේව මාළිගාවේ තිරය දෙකඩ වීමෙන් සංකේතවත් කරනුයේ,

I. මහත් ශෝකයක් පිළිබඳ පණිවිඩය
II. දෙවියන් වහන්සේගේ උත්තරීතර වැඩසිටීම
III. ක්‍රිස්තු උත්ථානය සිදුවන බව
IV. දෙවියන් වහන්සේ වෙත යාමේ මග විවෘත වීම
V. උත්ථානයේ පණිවිඩය ප්‍රකාශ වීම

45. දේව රාජ්‍යය සුළුවෙන් හා අදෘශ්‍යමාන ලෙස ආරම්භ වී කල් යත්ම ප්‍රකාශයට පත්වන බව සඳහන් කරන උපමාව වනුයේ.

I. නිධානය පිළිබඳ උපමාව
II. දැල පිළිබඳ උපමාව
III. කිරිඳ හා තිරිඟු පිළිබඳ උපමාව
IV. අබ ඇටය පිළිබඳ උපමාව
V. මුතු ඇටය පිළිබඳ උපමාව

46. කිතුනු විවාහයේ ප්‍රධාන අරමුණ වන්නේ ,

I. තම වර්ගයා බෝ කිරීම
II. දරුවන් බිහි කිරීම ඇති දැඩි කිරීම
III. ගුණ දහමින් යුතු දරුවන් බිහි කිරීම
IV. දරුවන්ට අධ්‍යාපනය දීම
V. දරුවන් ජනනය කිරීම

47. ගීතාවලියේ සඳහන් ගීතිකා ක්‍රිස්තුන් වහන්සේ ගේ ඉගැන්වීම් වලට භාවිතා කර ඇති අවස්ථාව වනුයේ,

I. කුරුස ගසේදී
II. සිමියොන්ගේ පැසසුම් ගීය
III. පව්කාර ස්ත්‍රියට ගල් ගැසීමේ සිද්ධියේදී
IV. මරිය උදාන ගීය
V. පරමණ්ඩලය

48. ඊසාක් සිය මෙහෙකරුවන් සමඟ කණින ලද තුන්වන ළිඳට තබන ලද නාමය,

I. නෙගෙබ්
II. සින්නා
III. ඒසෙක්
IV. ගෙරාර්
V. රෙහෙබොත්

49. ජුදා ජනතාවට දේව නමස්කාරයට පෙර සිදු කළ සිරිතක් වන්නේ,

I. වස්ත්‍ර සෝදා පවිත්‍ර වීම
II. ස්ත්‍රී සේවනයේ වැළකීම
III. දේව මාළිගාවේ රැදී සිටීම
IV. පාස්කු බැටළුවා පිදීම
V. අත්පා සෝදා පවිත්‍ර වීම

50. කිතුනු ජන වන්දනාවේ උතුම්ම අංගය වනුයේ,

I. දසපණත
II. ප්‍රසාද නිධාන
III. දිව්‍ය පූජාව
IV. දේවස්ථාන මංගල්‍යය
V. යාම යැදුම

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 12 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- ක්‍රිස්තියානි ධර්මය - II

පාසලේ නම : ..............................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැ.3 යි

## II පත්‍රය

I කොටසින් ප්‍රශ්න දෙකක්ද II කොටසින් ප්‍රශ්න තුනක්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න

## I කොටස

01 I. සමාරියාවේ මධ්‍යම කඳුකරය තුළ පිහිටා තිබූ වැදගත් ස්ථාන හතරක් ලියන්න.

II. ක්‍රි.පූ. 37 දී ජීවත් වූ මහා හෙරෝද් රජතුමා හැඳින්වීමට එතුමා පිළිබඳව කරුණු හතරක් ලියන්න.

III. සැලැස්මකට අනුව ගොඩනගා තිබෙන මැවීම පිළිබඳ පළමු කතාවේ සෑම දිනයකටම අදාළ පොදු ලක්‍ෂණ හතරක් ලියන්න.

IV. J හෙවත් යාවේ සම්ප්‍රදාය තුළ අඩංගු භාෂා හා සාහිත්‍ය ලක්‍ෂණ හතරක් ලියන්න.

V. ගලීල මුහුද අවට පිහිටි නගර හතරක් ලියා දක්වන්න.

(4x5 = 20)

02 I. ජාකෝබ් තම පුත්‍රයන් දොළොස් දෙනාගෙන් ජෝසප්ට වඩාත් ඇලුම් කිරීමට හේතු හතරක් ලියන්න.

II. පාස්කු ජන වන්දනාවේ සිදුකළ ප්‍රධාන අංග හතරක් ලියන්න.

III. සම්ප්‍රදායන් තුනක සංකලනයෙන් ගොඩනැගී ඇති මිසර වාසීන් වෙත දෙවියන් වහන්සේ එවූ වසංගත අතරින් මුල් වසංගත හතර ලියන්න.

IV. දස පනතෙහි ලක්‍ෂණ හතරක් ලියන්න.

V. ඉශ්‍රායල් ජනතාව නික්මයාම ගමන තුළ දිව්‍ය සංරක්‍ෂණය අත්දුටු අවස්ථා හතරක් ලියන්න.

(4x5 = 20)

03 I. පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ හතරක් දක්වන්න.

II. ගීතාවලියේ අඩංගු ගීත වර්ග හතරක් ලියා දක්වන්න.

III. හේබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රබේද හතරක් නම් කරන්න.

IV. දෙවියන් වහන්සේගෙන්ම ලද විශේෂිත කැඳවීමක් වූ දිවැසිවර කැඳවීමට අවේණික ලක්‍ෂණ හතරක් ලියන්න.

V. ''අපට ළදරුවෙක් උපන්නේය'' මෙමගින් දක්වන මෙසියස් වහන්සේගේ සුලක්‍ෂණ හතරක් ලියන්න.

(4x5 = 20)

## II කොටස

04 I. පලස්තීනයේ විසූ ප්‍රධාන ආගමික කණ්ඩායමක් වන පරිසිවරු හා විනයධරයන් පිළිබඳ ප්‍රධාන කරුණු පහක් යටතේ පැහැදිලි කරන්න.

II. වර්තමානයේ රට තුළ පවතින අසහනකාරී තත්වය ආගමික පසුබිමකින් සමනය කිරීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ග පහක් විස්තර කරන්න.

(2x10 = 20)

05 I. අසිරියානු විප්‍රවාස සමයේ ඒක දේව වන්දනාවට එරෙහිව පැන නැගුණු අභියෝග පහක් විස්තර කරන්න.

II. නූතන තාක්ෂණික හා නවීන මාධ්‍ය නිසා අදේවවාදය හා බහු දේව වාදයට වැඩි ඉඩකඩක් පවතී. එම අර්බුධකාරී තත්වය කරුණු පහකින් විස්තර කරන්න.

(2x10 = 20)

06 I. 1 කොරින්ති 13 ට අනුව සැබෑ ප්‍රේමය සඳහා අත්‍යවශ්‍ය වන ලක්ෂණ පහක් විස්තර කරන්න.

II. ශු. පාවුලු තුමාගේ චරිතයේ කැපී පෙනෙන ගුණාංග පහක් ඔබ චරිතායනය කරන ආකාරය ලියන්න.

(2x10 = 20)

07 I. මතෙව් ශුභාරංචිය තුළ බොහෝ ජුදෙව් ලක්ෂණ කැටිව ඇති බව නිදසුන් 5ක් ඇසුරින් විමසන්න.

II. මතෙව් තුමා දක්වන පරිදි ජේසුස් වහන්සේ අසාහය ගුරුවරයා නොහොත් දහම් ඇදුරාණන් ලෙස ඔබේ ජීවිතයට මඟ පෙන්වීමක් කරගන්නා ආකාර පහක් විස්තර කරන්න.

(2x10 = 20)

08 I. ''භාග්‍ය අට සර්වකාලීන සාරධර්ම සංග්‍රහයකි'' උදාහරණ ලෙස භාග්‍ය පහක් දක්වමින් ඉහත අදහස සනාථ කරන්න.

II. වපුරන්නාගේ උපමාව කෙටියෙන් ලියා එයින් ඔබගේ ජීවිතයට ගතහැකි පණිවිඩ පහක් විස්තර කරන්න.

(2x10 = 20)

ක්‍රිස්තියානි ධර්මය 2023 - 12 ශ්‍රේණිය

පිළිතුරු පත්‍රය

I පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 1. 2 | 11. 3 | 21. 1 | 31. 3 | 41. 1 |
| 2. 4 | 12. 1 | 22. 5 | 32. 2 | 42. 2 |
| 3. 1 | 13. 3 | 23. 1 | 33. 2 | 43. 3 |
| 4. 3 | 14. 5 | 24. 2 | 34. 3 | 44. 4 |
| 5. 3 | 15. 4 | 25. 4 | 35. 4 | 45. 4 |
| 6. 1 | 16. 4 | 26. 1 | 36. 1 | 46. 2 |
| 7. 5 | 17. 1 | 27. 4 | 37. 5 | 47. 1 |
| 8. 2 | 18. 2 | 28. 5 | 38. 2 | 48. 5 |
| 9. 4 | 19. 2 | 29. 3 | 39. 3 | 49. 5 |
| 10. 5 | 20. 5 | 30. 2 | 40. 5 | 50. 3 |

II පත්‍රය

I කොටස

(1) I.
1. බෙතෙල්, ෂිලෝ, හා ෂෙකෙම් ශුද්ධාසන
2. සමරිතානවරුන් දේවමාළිගාව තැනූ ගෙරසීම් කන්ද
3. ජෝසෙන් ඉෂ්මාලේවරුන්ට විකුණූ දොහාන්
4. සමාරියාව නගරය

II. ඉදුමීය ජාතිකයෙක්

ජුදා ආගම වැළඳගත්තෙක්

කෲර පාලකයෙක්

විවාහ 10 ක් කරගත්තෙක් (12 ගු මා 15 පිටුව)

III. දේව ආඥාව

දේව ආඥාව ඉෂ්ට වීම

දේව මැවිල්ල අගය කිරීම

කාලය ගණන් කිරීම

IV. සරල, විවිධ (12 ගු මා 20 පිටුව)

පැහැදිලි, නාට්‍යානුසාර

V. තපර්නාවු ව, බෙත්සයිදාව, මද්නලාව, තිබේරියස්

(2) I. රාකෙල්ගේ පුත්‍රයා , මහලු වියේදී ලද පුත්‍රයා වීම
ඔහු සිය සොහොයුරන් ගැන සොයා බැලීම
විශේෂ දේව බැල්මක් ඇති බව පෙනී යාම.

II. නුමුහුන් පුප, තිත්ත පලා, පාස්කු බැටළුවා, මිදියුෂ පානය

III. යතුර ලේවීම, මැඩි අවදුර, කිනිතුලු උවදුර, මැසි උවදුර

IV. විධායක නීති පද්ධතියක්, නිෂේධනාත්මක නීති 8, ප්‍රති ශේධනාත්මක නිති 2, සර්වකාලීනයි, දෙවිමිනිස් සබැදියාව ගොඩ නගයි.

V. වළාටැඹ, ගිනිජලාව, මන්නා භෝජනය, වටුවන් ලැබීම, මස්සා බෙරිබා හිදී ජලය ලැබීම, මරාහිදී ජලය ලැබීම.

(3) I. ජේබ්, ගීතාවලිය, ධර්මදේශකයා, උපදේශකයා හෙවත් සිරාක්, ප්‍රේමගී, ෂලමොන්ගේ ප්‍රඥාව, හිතෝදේශය

II. ප්‍රශංසා, විලාප, තුති දීමේ, ප්‍රඥා, රාජකීය, වන්දනා

III. පවුල හා ගෝත්‍රික රාජ්‍ය සභා, අභිධාර්මික, එදිනදා ජීවිතය සම්බන්ධ

IV. දේව දර්ශනය, දූත මෙහෙවර පැවරීම, කැඳවීම භාර ගැනීමට මැලි වීම, ධෛර්යමත් කිරීම, යවනු ලැබීම

V. අසිරිමත් උපදේශකයාණෝ, ප්‍රතාපවත් දෙවි තුමාණෝ, සදාතන පියාණෝ, සාමයේ කුමාරයාණෝ

II කොටස

(4) I. දේව දූතයන් හා ආත්මවල පැවැත්ම, මළවුන්ගේ නැවත නැගිටීම විශ්වාස කිරීම, ලිඛිත වාචික සම්ප්‍රදායන් පිළිගැනීම, දාවිත්ගේ වශයෙන් මෙසියස් වහන්සේ බලාපොරොත්තු වීම, චාරිත්‍රානුකුල ආගමික පිළිවෙත්, විශේෂ ඇඳුම්.

II. කරුණු පහක් යටතේ ගොනුකළ ආකාරයට.

(5) I. දාන් බෙතෙල් දේව මාළිගි ස්ථාපිතකොට ජෙරුසලමට යාම වැලැක්වීම දෙවියන් වෙනුවට රන් වස්සන් 2 කු තැබීම.
රූප වන්දනාව පැතිරීම , නමස්කාර දින දර්ශන වෙනස් කිරීම බාල් දේව විදනාව, බහුදේව වන්දනාව, ලෙවී ගෝත්‍රයෙන් පිට පූජකයන්

II. විද්‍යාව, තාක්ෂණය, මූලධර්මවාදී අදහස්, බහු සංස්කෘතිය, බහු ආගමික පරිසරය, මුහුණු පොත, අන්තර්ජාලය ආදී අවස්ථා ඇසුරින් ලියා ඇති ආකාරයට.

(6) I. ඉවසීම, කරුණාව, ඊර්ෂ්‍යා නොවීම, පාරට්ටු නොකිරීම, උඩඟු නොවීම, හනික නොකිපීම, අවිනීත නොවීම, හරිදේ ගැන ප්‍රීතිවීම ආදී,

II. නිර්භීත බව, නොපසුබට වීර්යය, කැපවීම, අවංකබව, දේවගරු බිය, ප්‍රඥා සතවාදී බව, අධිෂ්ඨානශිලී බව ආදී.

(7) I. පෙළපත දැක්වීම, ක්‍රිස්තුන් වහන්සේ පැරණි ගිවිසුමේ පූර්ණත්වය, ජුදෙව් ව්‍යවස්ථාවට නව මඟ පෙන්වීමක් ලබාදීම, ජුදා පිළිවෙත් සම්ප්‍රදායන්, ආදී

II. මතෙව් සුවිශේෂයෙන් ලබාගත් මඟ පෙන්වීම්

(8) I. භාග්‍ය 8 න් 5 ක් නිවැරදිව ලිවීම

II. වපුරන්නාගේ උපමාව ලිවීම
පණිවිඩ 5 ක් කෙටියෙන් විස්තර ඇතිනම්


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න